**පළාත් මාර්ග ව්‍යාපෘතියේ (නැගෙනහිර පළාත) - 2012**

-----------------------------------------------------------

1. **මතය.**

-------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව මා දරන්නා වූ මතය වනුයේ,

(අ) 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2012 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ විශේෂ (ඩොලර්) ගිණුමෙන් ආපසු ගැනීම් හා එම ගිණුමට ඌනපූර්ණය කිරීම් ව්‍යාපෘතිය විසින් පවත්වා ගනු ලැබූ පොත්පත් හා වාර්තාවල සත්‍ය හා සාධාරණ ලෙස හෙළිදරව් කර තබුණු බව සහ 2012 දෙසැම්බර් 31 දිනට ශේෂය එදිනට, ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණු බව,

(ඈ) ණය ගිවිසුමෙහි නියම කර ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූරණයන් සඳහා වූ ඉල්ලුම් පත්‍ර සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (වි ප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඉ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඊ) ණය ගිවිසුමෙහි දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී තිබුණු බවත්‍ය.

2. **මූල්‍ය ප්‍රකාශන.**

---------------

2.1 **මූල්‍ය කාර්ය සාධනය.**

------------------------

මූල්‍ය ප්‍රකාශනවලට හා විගණනයට ලබා ගත හැකි වූ තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂය සඳහා ව්‍යාපෘති වියදම රු.510,550,187 ක් වූ අතර 2012 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම රු.780,938,817 ක් විය. සමාලෝචිත වර්ෂය සඳහා වූ වියදම, ඉකුත් වර්ෂය සඳහා වූ වියදම සහ 2012 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම පිළිබඳ සාරාංශයක් පහත ප්‍රකාශයෙන් දැක්වේ.

| වියදම් විෂයය | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම | | 2012 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම |
|---|---|---|---|
| | 2012 | 2011 | රු. |
| | රු. | රු. | |
| සිවිල් වැඩ | 445,332,808 | 216,903,023 | 662,235,831 |
| ලී බඩු හා උපකරණ | - | 850,700 | 850,700 |
| කාර්යාල උපකරණ | 2,290,312 | 496,616 | 2,786,928 |
| උපදේශක සේවා | 57,980,410 | 41,174,136 | 99,154,546 |
| වර්ධක සහ මෙහෙයුම් පිරිවැය | 10,381,702 | 17,100,254 | 27,481,956 |
| ප්‍රත්‍යාගණන හා අගය අඩු කිරීමේ ගිණුම | (5,435,045) | (6,136,099) | (11,571,144) |
| එකතුව | 510,550,187 | 270,388,630 | 780,938,817 |

## 2.2 විශේෂ (ඩොලර්) ගිණුම්

මුල්‍ය ප්‍රකාශනවලට හා ලබාගත හැකි වූ තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂය තුළ ව්‍යාපෘතියේ විශේෂ (ඩොලර්) ගිණුමේ මෙහෙයුම් සාරාංශ කර පහත දැක්වේ.

| | එ.ජ. ඩොලර් | රු. |
|---|---|---|
| 2012 ජනවාරි 01 දිනට ශේෂය | 359,654 | 40,965,051 |
| එකතු කළා :- ඌනපූර්ණයන් | 4,786,895 | 624,581,664 |
| | 5,146,549 | 665,546,715 |
| අඩුකළා :- | | |
| ආපසු ගැනීම් (විආ) | (3,829,833) | (497,277,408) |
| ආපසු ගැනීම් (ප්‍රවිආ) | (144,185) | (18,300,616) |
| විදේශ විනිමය පාඩුව | - | (868,835) |
| 2012 දෙසැම්බර් 31 දිනට ශේෂය | 1,172,531 | 149,099,856 |

## 3. මූල්‍ය හා භෞතික කාර්ය සාධනය

### 3.1 අරමුදල් උපයෝජනය

සමාලෝචිත වර්ෂයේ ශ්‍රී ලංකා රජයේ වාර්ෂික ඇස්තමේන්තුවල මෙම ව්‍යාපෘතිය සඳහා ඒකාබද්ධ අරමුදල , ප්‍රතිපූර්ණය කළ හැකි විදේශාධාර හා විදේශාධාර යටතේ සලසන ලද මූල්‍ය ප්‍රතිපාදනය පිළිවෙලින් රු.5,000,000 ක් , රු.23,000,000 ක් , රු.500,000,000 ක් විය. සමාලෝචිත වර්ෂය තුළ මුළු ප්‍රතිපාදනය , තථ්‍ය වියදම හා අරමුදල් උපයෝජනයේ ප්‍රතිශතය පහත දැක්වේ.

| | මුළු ශුද්ධ ප්‍රතිපාදනය | තථ්‍ය වියදම | උපයෝජනයේ ප්‍රතිශතය |
|---|---|---|---|
| | රු. | රු. | % |
| ඒකාබද්ධ අරමුදල | 5,000,000 | 2,224,612 | 44 |
| ප්‍රතිපූරණය කළ හැකි විදේශාධාර | 23,000,000 | 18,300,616 | 80 |
| විදේශාධාර | 500,000,000 | 497,377,408* | 99 |
| | 528,000,000 | 517,902,636* | 98 |

* රු.5,435,046 ක් වූ විදේශ විනිමය වාසිය, සමාලෝචිත වර්ෂයේ විදේශාධාර යටතේ තථ්‍ය වියදමෙහි ඇතුළත් කර තිබුණි.

### 3.2 ඉදිකිරීම් වැඩ ප්‍රගතිය

විගණනයට ඉදිරිපත් කරන ලද ප්‍රගති වාර්තා අනුව, 2012 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ප්‍රගතිය පහත දැක්වේ.

| පැකේජ අංකය | මාර්ග දිග | මුළු කොන්ත්‍රාත් අගය | ආරම්භ කළ දිනය | නිමකළ දිනය | 2012 දෙසැම්බර් 31 දිනට ප්‍රගතිය | |
|---|---|---|---|---|---|---|
| | | | | | මූල්‍ය | භෞතික |
| | කි.මි. | රු. | | | % | % |
| ඊපී 01 | 09.55 | 445,646,012 | 2011-08-22 | 2013-02-21 | 34 | 64 |
| ඊපී 02 | 09.00 | 403,416,891 | 2011-04-23 | 2013-04-23 | 42 | 66 |
| ඊපී 04 | 23.00 | 499,139,693 | 2011-08-23 | 2013-02-21 | 50 | 75 |
| ඊපී 05 | 9.60 | 411,364,269 | 2012-05-23 | 2013-11-22 | 22 | 20 |
| | 51.15 | 1,759,566,865 | | | | |

5.3 කොන්ත්‍රාත් ගිවිසුම් සහ පසුව අනුමත කරන ලද කාලය දීර්ඝ කිරීම් අනුව , පහත දැක්වෙන වැඩ වල වැඩ නිමකිරීම සඳහා දීර්ඝ කිරීම් දිනයන් නියම කර තිබුණි. කෙසේ වුවද, 2013 ජුනි 10 දින කරන ලද භෞතික පරීක්ෂණයට අනුව, පහත විස්තර දැක්වෙන පරිදි වැඩ නිම කර නොතිබුණි.

| **කොන්ත්‍රාත් පැකේජය** | **නිමකළ දිනය** | **දීර්ඝ කළ දිනය** | **2013 ජුනි 10 දිනට නිම කිරීමේ ප්‍රතිශතය** |
|---|---|---|---|
| ඊපී 01 | 2013-02-02 | 2013-06-02 | 91% |
| ඊපී 02 | 2013-04-23 | 2013-05-21 | 90% |
| ඊපී 04 | 2013-02-21 | 2013-05-29 | 94% |

**4. පද්ධති හා පාලන.**

--------------------

පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(අ) ගිණුම් වාර්තා පවත්වා ගැනීම.

(ආ) ප්‍රසම්පාදන

(ඇ) බදු ගෙවීම්